**කරෙයිතීවු ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට කරෙයිතීවු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණ** | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභා කාර්යාලය සහ පුස්තකාලය පිහිටා තිබෙන සභාව සතු ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි. | ඉඩම්වල වටිනාකම ස්ථාවර වත්කම් වශයෙන් ගිණුම්වල දැක්විය යුතු වේ. | වටිනාකම තක්සේරු කිරීම සඳහා දැනට කටයුතු කරගෙන යන අතර, එහි වටිනාකම ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල වෙනමම පෙන්වන බව දක්වා සිටිමි. |
| (ii) | සභාව සතු රු. 5,400,000 ක් වටිනා ලොරි රථය 2012 වර්ෂයේ අනතුරට ලක් වී සම්පූර්ණයෙන් හානිවූ අතර ඒ සඳහා වන්දි මුදල ලැබී තිබුණද, ගිණුම්වලින් මෙම වාහනයේ වටිනාකම කපා හැර නොතිබුණි. | හානිවූ ලොරි රථයේ වටිනාකම ස්ථාවර වත්කම් වල වටිනා කමින් අඩුකළ යුතු වේ. | අදාල වාහන සහකාර ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) නැ.ප. මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ඇති අතර, විකුණු මිල සහ වාර්තා මෙතෙක් ලැබී නැත. අදාල වාර්තාව ලැබුනු පසු ඉදිරි වර්ෂයේ ගිණුම්වල කපා හැරීමට කටයුතු කරනු ලැබේ. |
| (iii) | සභාවට ලැබී තිබූ මාර්ග තලන යන්ත්‍ර 2 ක් සහ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර 01 ක වටිනාකම තක්සේරුකර ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි. | වාහන සහ යන්ත්‍රවල වටිනාකම ස්ථාවර වත්කම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනයේ දැක්විය යුතු වේ. | මාර්ග තලන යන්ත්‍ර 2009 වර්ෂයේ යුනප්ස් ආයතනයෙන් ආධාරයක් වශයෙන් ලැබී තිබුණි. අදාල යන්ත්‍රයේ වටිනාකම අවසාන ගිණුම්වල හඳුනා නොගත් වටිනාකම යටතේ දක්වා ඇත. ඉදිරි මුදල් වර්ෂයේ යන්ත්‍රවල වටිනාකම වෙන්වෙන් වශයෙන් දැක්වීමට කටයුතු කරමි. |

**(ආ)** විගණනයට අවශ්‍ය **ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ඉඩම් ඔප්පු වත්කම් ලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා, අයිතිය තහවුරු කිරීමේ ලේඛන නොමැති වීම නිසා එකතුව රු. 9,886,142 ක් වටිනා ස්ථාවර වත්කම් විගණනයේදි සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය / සන්නිරීක්ෂණය කිරීමට හොහැකි විය. | ගිණුම්ශේෂ සනාථ කරන සාක්ෂි සහ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතු වේ. | ස්ථාවර වත්කම් හැකිතාක් දුරට එහි වටිනාකම තක්සේරු කර ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවේ එම වටිනාකම වෙන්වෙන් වශයෙන් දැක්වීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මු.රෙ. 371 | ලේකම් වෙත ලබා දුන් අත්තිකාරම් 3 ක් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව අත්තිකාරම් මුදල් පියවා ගිණුම් නිරවුල් කළ යුතු වේ. | අවසන් ගිණුම්වල මෙම මුදල ලැබීයයුතු සහ ගෙවියයුතු අත්තිකාරම් වශයෙන් දක්වා ඇති බව දන්වන අතර, මෙය නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | මු.රෙ. 571 | කල් ඉකුත්වූ තැන්පත් පහක් අදාල අයවෙත ආපසු ගෙවීමට හෝ ආදායම් ගිණුමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත්වූ තැන්පත් මුදල්, මුදල් රෙගුලාසි අනුව අදාල අයට ආපසු ගෙවීමට හෝ ආදායම් ගිණුමට මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල තැන්පත් මුදල ඉදිරි මුදල් වර්ෂයේ සභාවේ ආදායමට ගැනීමට මාරු කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

**----------------------**

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

**----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,563,514 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම් ඉක්ම වූ වියදම රු.1,443,891 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 25,000 | 2,500 | 2,500 | - | 25,000 | - | - | - |
| කුලී | 4,325,000 | 3,978,762 | 3,978,762 | 652,725 | 2,550,000 | 2,880,096 | 2,901,026 | 652,725 |
| බලපත්‍ර ගාස්තු | 1,458,000 | 4,045,085 | 3,757,676 | 4,025,105 | 2,558,000 | 1,094,903 | 1,089,334 | 3,737,696 |
| වෙනත් ආදායම් | 6,717,500 | 5,394,791 | 5,394,791 | - | 5,560,000 | 2,649,033 | 2,649,033 | - |

**2.2.2 කුලී**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කල්මුනේ මහ නගර සභාව, සමන්තුරේ ප්‍රාදේශීය සභාව සහ නින්තවූර් ප්‍රාදේශීය සභා වලින් රැගෙන එන කසල කරෙයිතීවු සහා බලප්‍රදේශීයේ එකතුකර මාරු කිරීම වෙනුවෙන් අයවියයුතු රු. 3,725,342 ක මුදල අයකර ගැනීමට වසර තුනක සිට කිසිම පියවරක් නොගෙන මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව දක්වා තිබුණි. | අදාල හිඟ මුදල සභාව වලින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම හිඟ මුදල ගෙවන ලෙස ලියුම් යවා ඇතත් එම මුදල අයවී නොතිබුණි. තවද, පළාත් පාලන කොමසාරිස් විසින් කල්මුනේ මහ නගර සභාවට යවා තිබූ ලිපියේ මෙම මුදල පියවිය යුතුබව දැනුවත් කර තිබුණද පියවා නොතිබුණි. තවද, පළාත් පාලන කොමසාරිස් උපදෙස් අනුව කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | 1992 වර්ෂයේ සිට 2015 දක්වා හිඟව තිබුණු මස්කඩ බදු කුලිය රු. 671,710 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල අදාල අයගෙන් අයකර ගැනීමට හෝ ගිණුම්වලින් නීතියානුකූලව කපා හැරීමට හෝ කටයුතු කළ යුතු වේ. | අදාල හිඟ මුදල කපා හැරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය අනුව කටයුතු කර ඇති බව දන්වා සිටිමි. |
| (ඇ) | පදික වෙළඳ හිඟ බදු රු. 15,000 ක් 2008 වර්ෂයේ සිට වසර 10 ක කාලයක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල හිඟ මුදල ගිණුම්වලින් නීතියානුකූලව කපා හැරීමට කටයුතු කළ යුතු වේ. | 2008 වර්ෂයේ පදික වෙළඳ බදුකරු කෝ.වෙට්‍රිවේල් මහතාගේ හිඟ මුදලත් ඔහු මිය ගිය බැවින් අදාල මුදල අයකර ගැනීමට නොහැකිව ඇත. මෙම මුදල කපා හැරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඈ) | වෙරළ උද්‍යානය හිඟ බදු රු. 26,000 ක් 2015 වර්ෂයේ සිට අද දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වෙරළ උද්‍යානයේ හිඟ බදු අදාල තැනැත්තාගෙන් නීත්‍යානුකූලව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල හිඟ මුදල අදාල පුද්ගලයාගෙන් අයකර ගැනීමට කටයුතු කරන අතර, සමථ මණ්ඩලයට මගින් කටයුතු කිරීමට ක්‍රියාකරගෙන යන බව දන්වා සිටිමි. |

### 2.2.3 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බලප්‍රදේශයේ ඉදිකර තිබූ Hutch සහ Airtel යන සන්නිවේදන කුළුණු 02 ක් ඉදිකිරීම් සහ ගොඩනැගිලි අනුමැතිය සඳහාවූ ගාස්තු මෙතෙක් අයකර නොතිබුණි. | සභා බල ප්‍රදේශයේ ගොඩනැගිලි ඉදිකිරීමේදී ගොඩනැගිලි අනුමැතිය මගින් ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අදාල කරුණු සම්බන්ධයෙන්වූ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනත් 126 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභාවේ ආදායම් විධිමත් කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සකස්කර ක්‍රියාත්මක කළයුතු වූවත් 2018 දෙසැම්බර් 31 දක්වා කාරණා එකක් සඳහා පමණක් යෝජනා පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබුණි. | අනුමැතිය සඳහා යවන ලද අතුරු ව්‍යවස්ථා සඳහා අනුමැති ලබා ගැනීමට කටයුතු කළයුතුය. තවද, සභාවට උචිත අනෙකුත් කරුණු සම්බන්ධයෙන්ද අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අදාල කරුණු සම්බන්ධයෙන්වූ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා අවධානය යොමු කරන බව දන්වා සිටිමි. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සකස්කරන ලද අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ක්‍රියාත්මක කළයුතුව තිබූ කාරණා සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා අනුව ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්ෂික | ඉදිරියේදී අදාල කරුණු සම්බන්ධයෙන් අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

| | | |
|---|---|---|
| | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | |

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේදි සභාව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු පහසු කිරීම සඳහා මහජනයා වෙත ඝණ අපද්‍රව්‍ය එකතු කිරීමේ බෑග් 5000 බෙදා හැරීමේ සැලැස්මක් ක්‍රියාත්මක කර බෑග් 4,748 බෙදාහැර තිබුණද, ඝණ අපද්‍රව්‍ය වර්ගී කරනයෙන් තොරව භාර නොගෙන දිගටම එකතු කරනු ලැබේ. | ඝන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් මහජනයාට දැනුවත්කර, එකතු කරන ඝන අපද්‍රව්‍ය වෙන්වෙන් වශයෙන් බෑග්වල දමා භාරගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අදාල කරුණු සම්බන්ධයෙන්වූ අඩුපාඩු සකස්කිරීමට අවධානය යොමුකරන බව දන්වා සිටිමි. |

(ඈ) තිරිසාර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව 2030 වර්ෂයේ එක්සත් ජාතින්ගේ න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි සෑම පොදු ආයතනයම ක්‍රියා කළ යුතුයි. එසේ වුවත් මේ සම්බන්ධ ඉලක්ක හඳුනාගෙන ළඟා කරගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් ඉලක්ක හඳුනාගෙන ළඟා කරගැනීමට ඒවා මැනීම සඳහා දර්ශක ඇතිකර ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අදාල කරුණු සම්බන්ධයෙන් අඩුපාඩු සකස්කර ගැනීමට අවධානය යොමුකර බව දන්වා සිටිමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ කාර්යාල ගොඩනැගිලි ඉදිකර ඇති ඉඩම් සහ සභාවේ සංස්කෘතික ගොඩනැගිල්ල ඉදිකර ඇති ඉඩම් කරයිතිවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ඉඩම් ආඥා පනතේ 27 වගන්තිය අනුව නිදහස් නොකර තිබුණි. | රජය සතු ඉඩම් රජයේ ඉඩම් ආඥා පනත අනුව නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් කටයුතු කර ඇති බව දන්වා සිටිමි. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ තනතුරු 05 ක පුරප්පාඩු 06 ක් පැවතුනි | සභාවේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | අදාල පුරප්පාඩු සඳහා ආදේශ පදනමින් සේවකයන් යොදවා ඇති බව දන්වා සිටිමි. තවද, පළාත් පාලන කොමසාරිස් සහ අමාත්‍යාංශයේ ලේකම් වෙත පුරප්පාඩු පිළිබඳ විස්තර යවා ඇත. |
| (ආ) | සභාවේ නිලධාරීන් 07 දෙනෙකුගෙන් රු. 40,647 ක් වටිනා හිඟ සේවක ණය ශේෂයක් 2006 වර්ෂයේ සිට අය නොවී පැවතුණි. | හිඟ ණය ශේෂ අදාල අයගෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | දැනට එම හිඟ ණය ශේෂ කපා හැරීමටද. අයකර ගත හැකි අයගෙන් අයකර ගැනීමටද තීරණය කළ බව දන්වා සිටිමි. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ තිබෙන වෙළඳ ස්ථාන 350 සහ නිවාස 5660 කින් 2003 වර්ෂය සිට වරිපනම් බදු තක්සේරුකර අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් වාර්ෂිකව රු. 3,000,000 ක් පමණ ආදායමක් අහිමි වී ඇත. | සභා බල ප්‍රදේශයේ දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් අයකිරීමෙන් සභාවේ ආදායම වැඩිකරගත යුතු වේ. | වරිපනම් බදු සම්බන්ධයෙන් 2018.08.10 දින ගන්නා ලද සභා තීරණය අනුව කාරෙයිතිවු ප්‍රදේශයේ ජීවත්වන මහජනයා දුගී බවෙන පෙළෙන බව මන්ත්‍රීන් පෙන්වාදුන් බවද, මෙම කටයුතු වර්ෂ දෙකකට කල් තබන ලදි. |
| (ආ) | සභා බලප්‍රදේශයේ වෙළඳ ආයතනවල ප්‍රදර්ශන කර තිබෙන, ප්‍රචාරක බැනර් දැන්වීම් සඳහා දැන්වීම් ගාස්තු අයකර ගැනීමට අතුරු ව්‍යවස්ථා පනවා නොතිබීමෙන් සභාවට රු. 100,000 ක පමණ දැන්වීම් ගාස්තු අහිමි වී තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා දැන්වීම් ගාස්තු අයකර සභාවේ ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල අතුරු ව්‍යවස්ථා පිළියෙල කර පළාත් සභාව වෙත යවා ඇතත්, නිශ්චිත කාල පරිච්ඡේදයතුල අනුමැතිය ලැබී නොතිබුණි. එහෙයින් නීතියානුකූලව කටයුතු කර ගැනීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත් අනෙක් සභාවල අනුමතකරන ලද අතුරු ව්‍යවස්ථා අනුව අපගේ සභාවද ගාස්තු අයකරන බව දන්වා සිටිමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම් ලේඛන ගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ ස්ථාවර වත්කම් ලේඛනය සමාලෝචිත වර්ෂයේ යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර ගිණුම් වල හෙළදරව් කළ යුතු වේ. | සභාව විසින් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගෙන යන අතර වත්කම් සත්‍යාක්ෂණය කර නොතිබීමෙන් යාවත්කාලීන කර නොතිබුණි. ඉදිරියේදි අදාල කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකරන බව දන්වා සිටිමි. |

### 3.5.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා ට්‍රැක්ටරයක් ලියාපදිංචි කර නොතිබුණි. | ට්‍රැක්ටරය ලියාපදිංචි කළ යුතු වේ. | අදාල කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකරන බව දන්වා සිටිමි. |

### 3.5.3 නඩත්තු හා අළුත්වැඩියා නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව සතු යතුරු පැදි 03, ලොරි 02, ට්‍රැක්ටර් ටේලර් 04 යන වාහන 09 ක් අළුත්වැඩියා කළයුතු තත්වයේ පැවතියද, මෙතෙක් අළුත්වැඩියා කර නොතිබුණි. | වාහන වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශය අනුව අපහරනය කිරීමට හෝ අළුත්වැඩියා කර නැවත පාවිච්චි කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල වාහන අළුත්වැඩියා සඳහා යන වියදම හා සාපේක්ෂව එහි ප්‍රයෝජන අඩු බැවින් අළුත්වැඩියා නොකර තිබුණි. අදාල වාහන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) නැ.ප. මගින් අපහරණ කිරීමට හෝ වෙනදේසි කිරීමට කටයුතු කර ඇත. |

### 3.5.4 නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | උතුරු නැගෙනහිර වෙරළ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘත්තිය (NECCDEP) මූල්‍ය ආධාර යටතේ රු. 14,347,200 ක වටිනාකමට ඉදිකර 2019 වර්ෂයේදී සභාවට භාරදී තිබූ වෙළඳ සංකීර්ණය කඩ කාමර 20 කින් සමන්විත වුවද, කඩ කාමර 04 ක් පමණක් බදු දී තිබුණි. අනෙකුත් කඩ කාමර 16 ක් වර්ෂ 10 ක කාලයක සිට නිෂ්කාර්යව පැවතුනි. | කඩ කාමර බදු දීමට ක්‍රියාකළ යුතු වේ. නැතහොත් වෙනත් අවශ්‍යතාවයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | දැනට වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ සභා තීරණය කර අනුව Food City එකක් විවෘත කිරීමට කටයුතු කර ඇත. ඉදිරියේදී අදාල ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගැනීමට හැකිවේයයි බලාපොරොත්තු වෙමි. |
| (ආ) | ඝන අපද්‍රව්‍ය පරිවර්තන මධ්‍යස්ථානයේ කසල වර්ගීකරණය කර කොම්පොස්ට් පොහොර නිෂ්පාදන කිරීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ආධාර යටතේ 2017 වර්ෂයේදි ඉදිකරන ලද රු. 1,367,782 ක් වටිනා ගොඩනැගිල්ල සහ 2018 වර්ෂයේදී ලබා දෙන ලද රු. මිලියන 01 ක වටිනා භාණ්ඩද, 2019 මැයි 07 දින දක්වා කිසිම කටයුත්තක් සඳහා තොරව නිෂ්ක්‍රීයව තිබුණි. | අදාල ගොඩනැගිල්ල පොහොර නිෂ්පාදනය සඳහා යොදාගත යුතු වේ. | 2017 වර්ෂයේ ගොඩනැගිල්ල ඉදිකළද පොහොර නිෂ්පාදනයට අවශ්‍ය යන්ත්‍ර 2018 අවසන් කොටසේ ලැබී තිබුණි. යන්ත්‍ර ලැබීමෙන් පසු අත්හදා බැලීමක් වශයෙන් සෙනසුරාදා දිනවල පමණක් පොහොර නිෂ්පාදනය කිරීමට කටයුතු කර තිබුණි. සතිය පුරාම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

### 3.5.5 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට ලබා තිබූ ගල් රෝල් 02 ක් (Road Roller) සහ කොන්ක්‍රීට් මිශ්‍රණය 01 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | අදාල යන්ත්‍ර යලි ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල වාහන අළුත්වැඩියා සඳහා යන වියදම හා සාපේක්ෂව එහි ප්‍රයෝජන අඩු බැවින් අළුත්වැඩියා නොකර තිබුණි. අදාල වාහන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) නැ.ප. මගින් අපහරණය කිරීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කර ඇත. |

## 4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලන

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ උප වගන්තිය 16(2) අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වේ. | අදාල කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර ඇති බව දන්වා සිටිමි. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා රැස්වීම් පවත්වීමට කටයුතු කළ යුතු වේ. | අදාල කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර ඇති බව දන්වා සිටිමි. |